## 2022 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම
## උතුරු කොළඹ ශික්ෂණ රෝහල -රාගම

2022 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා මෙම රෝහල යටතේ ලියාපදිංචි වීමට අදහස් කරන, පිළිගත් නිෂ්පාදකයින් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් / අනුමත බෙදාහරින්නන් / සැපයුම්කරුවන් හා රාජ්‍ය ආයතන වලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01 සැපයුම්

1. කාර්යාල ලිපිද්‍රව්‍ය (පරිගණක ලිපිද්‍රව්‍ය ඇතුළුව)
2. කාර්යාල ගෘහ භාණ්ඩ(දැව, වානේ, ෆයිබර්ග්ලාස්)
3. කාර්යාල උපකරණ (ඡායා පිටපත් යන්ත්‍ර, ඩිජිටල් ඩුප්ලිකේටර්ස්, ෆැක්ස් යන්ත්‍ර, ගණක යන්ත්‍ර හා වෙනත් කාර්යාල උපකරණ)
4. පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග
5. විදුලි උපකරණ (වායුසමන යන්ත්‍ර, ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර , විදුලිපංකා)
6. නිල ඇඳුම් රෙදි/ සියලුම වර්ගයේ රෝහල් රෙදිපිළි (ඇඳ ඇතිරිලි , කොට්ට රෙදි , තිර රෙදි, තුවා, මදුරු දැල්, පුළුන් කොට්ට යනාදිය)
7. බොයිලේරු, ජෝගු, සාස්පාන් සහ විදුලි දහර(එලිමන්ට්)
8. හාඩ්වෙයාර් භාණ්ඩ (යකඩ පයිප්ප, ට්‍රොලි සඳහා රෝද, ඇණ හා මුරිච්චි, ඉබි යතුරු, කුඩා මෙවලම් යනාදිය).
9. වාහන සඳහා ටයර් ටියුබ් හා බැටරි
10. පී. වී.සී. පයිප්ප ඇතුළු ජලනල වැද්දුම් ද්‍රව්‍ය.
11. කුණු කසළ බැහැර කරන පොලිතින් බෑග්.
12. විදුලි සවිකිරීම් හා විදුලිය සැපයීමට අවශ්‍ය විදුලි බුබුලු , විදුලි රැහැන් , විවිධ ස්විච් ආදිය.
13. රබර් මිශ්‍රිත කොහු මෙට්ට හා රබර් මෙට්ට.
14. මැකිංටොෂ් හා රෙක්සින්.
15. පාවහන්, සම් හා සම් භාණ්ඩ.
16. බ්ලේඩ් තල(රැවුල බෑම සඳහා).
17. වෛද්‍ය උපකරණ.
18. රසායනාගාර උපකරණ.
19. ඖෂධ.
20. ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය.
21. රසායනික ද්‍රව්‍ය /රසායනාගාර පාරිභෝජ්‍ය ද්‍රව්‍ය.
22. වෛද්‍ය උපකරණ සහ රසායනාගාර උපකරණ අමතර කොටස් සැපයීම සහ අලුත්වැඩියා කිරීම.
23. රෝහල් ඇඳන්, ගිලන් මැසි, ට්‍රොලි , කෑම ට්‍රොලි, රෝද පුටු , සේලයින් ස්ටෑන්ඩ්, ඔක්සිජන් ස්ටෑන්ඩ්.
24. සුවඳ සබන්, රෙදි සෝදන සබන්, රෙදි සෝදන කුඩු හා පිරිසිදු කිරීමේ කුඩු.
25. විකලාංග කාර්මිකාගාරයට අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ (SLSPO)
26. CCTV කැමරා පද්ධති සවිකිරීම සහ අලුත්වැඩියා කිරීම.
27. අභ්‍යන්තර දුරකථන පද්ධති සැකසීම , නඩත්තු සහ සේවා කිරීම.

02. සේවාවන්

1. වායුසමීකරණ යන්ත්‍ර සහ ශීතකරණ, මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය, මෘත ශරීරාගාර ශීතකරණ පද්ධතිය නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
2. පරිගණක යන්ත්‍ර, ප්‍රින්ටර්, ෆැක්ස්, ෆොටෝකොපි, චෙක්පත් මුද්‍රණ යන්ත්‍ර, ඩුප්ලෝ යන්ත්‍ර, මල්ටිමීඩියා යන්ත්‍ර, යතුරුලියන ඇතුළු කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම.
3. රෙදි සෝදන යන්ත්‍ර, විදුලි පංකා, වතුර මෝටර්, විදුලි කේතල්, බොයිලේරු, රූපවාහිනී යන්ත්‍ර, මහන මැෂින්, මයික්‍රොවේව් අවන් ඇතුළු අනෙකුත් විදුලි උපකරණ අලුත්වැඩියාව.
4. මහජන ඇමතුම් පද්ධති සපයා සවි කිරීම සහ අලුත්වැඩියා කිරීම.
5. වැඩහල්වල (Work Shop), පවතින බල මෙවලම් (Power Tools) ඇතුළු වෙනත් උපකරණ අලුත්වැඩියාව.
6. පුටු විවීම සහ ලී බඩු අලුත්වැඩියාව.
7. ගෑස් උදුන් සහ ගෑස් පද්ධති අලුත්වැඩියාව.
8. ඩිජිටල් ප්‍රින්ටින්(බැනර් සඳහා), දින මුද්‍රා, රබර් මුද්‍රා, ප්ලාස්ටික් වැඩ, නාම පුවරු, දැන්වීම් පුවරු සහ ස්ටිකර් සැකසීම.
9. රාජකාරි හැඳුනුම්පත් සැකසීම.
10. වාහන අලුත්වැඩියාව.
11. වාහන සේවා කිරීම.
12. වාහන වායුසමීකරණ පද්ධති අලුත්වැඩියාව.
13. වාහන විදුලි පද්ධති අලුත්වැඩියාව.
14. ප්‍රවාහන පහසුකම් සැපයීම (මගී සහ භාණ්ඩ).
15. වානිජමය වටිනාකමක් නොමැති ගස් සහ අතු කපා ඉවත් කිරීම.
16. අන්තර්ජාල පද්ධතිය අලුත්වැඩියා සහ සේවා කිරීම.
17. විශේෂිත රෝද පුටු නිකල් කිරීම /ගැල්වනයිස් කිරීම/Powder Cotting කිරීම.
18. විදුලිජනක යන්ත්‍ර නඩත්තු සහ සේවා කිරීම..
19. විදුලි සෝපාන නඩත්තු සහ සේවා කිරීම.

*2.10, 2.11, 2.12, හා 2.13 යටතේ ඇති සේවාවන් සඳහා ජා ඇල, වත්තල, මහර හා කැළණිය යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල පිහිටි සේවා ආයතන වලට ප්‍රමුඛතාවය දෙනු ලැබේ..

03. <u>කොන්දේසි</u>

3.1 ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් එක් අයිතමයක් සඳහා රු.500.00 ක් (ආපසු නොගෙවන) මුදලින් **2021.10.21.** දින සිට **2021.11.19** දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව.2.30 දක්වා උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ සරප් වෙත පැමිණ ගෙවිය යුතු අතර ඒ සඳහා රෝහලෙන් නිකුත් කරන රිසිට් පත්‍රයේ (පොදු 172) මුල් පිටපත අයදුම්පතට අමුණා එවිය යුතුය (**<u>මුදල් ඇණවුම් , චෙක්පත් භාරගනු නොලැබේ</u>**). එක් අයදුම්කරුවෙක් ඉල්ලුම්පත් කීපයක් එවන්නේ නම් ඒ සියළුම අයදුම්පත් එක කවරයක බහා එවිය හැකිය.

3.2 භාණ්ඩ හා සේවා සපයා ගැනීමේදී සාමාන්‍යයෙන් ලියාපදිංචි වී සිටින සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් විමසන නමුත් වෙනත් ප්‍රභවයන්ගෙන්ද මිල ගණන් විමසීමේ අයිතිය රෝහල් අධ්‍යක්ෂට ඇත.

3.3 ඉල්ලා සිටින විට මිල ගණන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නා වූ ද , ඇණවුම් භාර දුන් පසු අදාළ භාණ්ඩ හෝ සේවා සැපයීමට අසමත් වන්නා වූද , අවශ්‍ය අවස්ථාවලදී සාම්පල් සහ විස්තරාත්මක තොරතුරු සැපයීම පැහැර හරින්නාවූ ද සැපයුම්කරුවන්ගේ නම් දැනුම් දීමකින් තොරව ලියාපදිංචි කිරීමේ ලේඛණයෙන් කපා හරිනු ලැබේ.

3.4 1.17 සිට 1.21 දක්වා ඇති අයිතම සැපයුම්කරුවන් විසින් තම ආයතනයේ ඇති උපකරණ හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලැයිස්තුවක් අයදුම්පතට ඇමිණිය යුතුය.

3.5 ගෙවීම කරනු ලබන්නේ ඇණවුම් කරන ලද භාණ්ඩ අපේක්ෂිත ප්‍රමිතියට අනුව සම්පූර්ණයෙන් භාර දීමෙන් පසුව හෝ නියමිත සේවාවන් සතුටුදායක අයුරින් ඉටු කිරීමෙන් පසුවය. **<u>සැපයුම්කරුවන් අවම වශයෙන් මාස 2ක කාලයක් සඳහාවත් ණය පහසුකම් සැලසිය යුතුය.</u>**

3.6 සැපයුම් කටයුතු කිරීමේදී මුදල් රෙගුලාසි සහ රජය මගින් වරින් වරට නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා කොන්දේසි වලට යටත් විය යුතුය.

3.7 ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් නිකුත් කිරීමක් සිදු නොකරනු ලබන අතර පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයට අනුව තමන් විසින් සකස්කර ගත් ඉල්ලුම්පත්‍රයක් මේ සඳහා භාවිතා කරන ලෙසට උපදෙස් දෙනු ලැබේ.

3.8 සියලුම අයදුම්පත් පහතු සඳහන් ලිපිනයට 2021.11.19 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම කළයුතු වන අතර කවරයේ වම් පස ඉහල කෙලවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2022"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. තවද එදිනට පසුව මේ සම්බන්ධ කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බැලිය නොහැක.

0112959261/2 දිගුව 722

වැඩි විස්තර ~~011-2951239~~ දරණ දුරකථන අංකයෙන් ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබා ගත හැක.

අධ්‍යක්ෂ,
උතුරු කොළඹ ශික්ෂණ රෝහල,
රාගම.

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය - 2022 වර්ෂය

01. ව්‍යාපාරයේ / සැපයුම්කරුගේ නම -.....................................................................

02. ලිපිනය-.....................................................................

03. ව්‍යාපාරික කටයුතුවලදී ඇමතිය යුතු තැනැත්තාගේ නම-.....................................................................

04. දුරකථන අංකය- ......................ෆැක්ස් අංකය -.....................................................................

05. විද්‍යුත් ලිපිනය - .....................................................................

06. ලියාපදිංචි වීමට අපේක්ෂිත සැපයුම් / සේවාවන්ගේ අංකය සහ නම - .....................................

.....................................................

07. ව්‍යාපාර සංවිධානයේ ස්භාවය (නිෂ්පාදන/ දේශීය නියෝජිත).....................................................

08. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ අංකය- ( අදාළ සහතිකයේ පිටපත අමුණන්න).......................

09. ණය පහසුකම්- (i) කාලසීමාව-............................(ii).වටිනාකම..............................

10. එකතුකළ අගය මත බදු ලියාපදිංචි (වැට් )අංකය - .....................................................

- අදාළ වර්ෂයට සක්‍රීය වැට් බදු ගෙවන්නෙකුද යන්න සනාථ කරන ලියවිලි ඉදිරිපත් කරන්න.

11 ලියාපදිංචි ගාස්තුව ගෙවූ රිසිට්පත් අංකය - .....................................................

දිනය - ..............................................   මුදල - ..............................................

12. ප්‍රවාහන පහසුකම් ලබා දෙන්නේද යන වග - :............................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරන අතර උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ කොන්දේසි පිළිබඳව මම / අපි එකඟ වෙමි /වෙමු.

| | | |
|---|---|---|
| ............................ | ............. | ...................... |
| අයදුම්කරුගේ අත්සන | දිනය | ආයතනයේ මුද්‍රාව |